**ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව - 2021**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 (ආ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය තුල සභාව සතු ගොඩනැගිලි වැඩිදියුණු කිරීම සඳහා දරන ලද රු. 5,292,848 ක වියදම් ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායක වීමේ ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ මුදල ජ'නල් සටහනක් මඟින් නිවැරදි කර ප්‍රාග්ධනික කිරීමට කටයුතු කරන බව. | ගොඩනැගිලි වැඩිදියුණු කිරීම සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු. 460,275 ක් වියදමක් ලෙස ගිණුම්ගත කිරීමේ දෝෂය සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුල මුද්දර ගාස්තු ඌන වෙන්කිරීම් රු. 5,875,970 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ජ'නල් සටහනකින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත උසාවි දඩ ආදායම රු. 1,861,109 ක් වුවත් එය රු. 1,051,566 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ අතිරික්තය හා ජංගම වත්කම් රු. 809,543 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඈ) | ඉකුත් වර්ෂවලට අදාල කර්මාන්ත ණයගැති රු. 5,558,803 ක් ණයගැති අධි වෙන් කිරීම් ලෙස කපා හැර තිබීම හා නැවත සමාලෝචිත වර්ෂයේ ණයගැතියන් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ප්‍රාග්ධන ආදායම එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි. | | |
| (ඉ) | ඉකුත් වර්ෂවලට අදාල කර්මාන්ත ණයහිමි රු. 4,130,949 ක් ණයහිමි අධි වෙන් කිරීම් ලෙස කපා හැර තිබීම හා නැවත සමාලෝචිත වර්ෂයේ ණයහිමි ලෙස ගිණුම්ගත කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි. | ජ'නල් සටහනකින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ ගිණුම් නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ජ'නල් සටහන් අංක 148 මගින් රු. 628,094 ක් ප්‍රාග්ධන වියදම් ගිණුම හර කරමින් ණයහිමි ගිණුමට බැරකර තිබුණ ද ඊට අදාල ගනුදෙනු හෝ ගිවිසුම්ගතවීම් කිසිවක් සමාලෝචිත වර්ෂය තුල සිදුව නොතිබීමෙන් වර්ෂයේ ප්‍රාග්ධන වියදම හා ණයහිමියෝ සමාන වටිනාකමින් වැඩියෙන් දැක්වුණි. | මෙම වරද 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා උපයෝගී ලේඛන අතර එකතුව රු. 1,110,667 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් ඊට අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(5) | 2002 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ හඳුනා නොගත් අත්තිකාරම් රු. 3,193,731 ක් පියවා ගැනීමට නොහැකි වීමෙන් කපාහැරීම සඳහා ආණ්ඩුකාරවර අනුමැතියට යොමුකර තිබුණු අතර 2010 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා නිකුත් කර තිබුණු එකතුව රු. 284,110 ක් වූ පුනරාවර්තන අත්තිකාරම් 03 ක් හා එකතුව රු. 638,586 ක් වූ ප්‍රාග්ධන අත්තිකාරම් 06 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් පියවා නොතිබුණි. | මෙම අත්තිකාරම් පියවීමට අදාළ වවුචර් පත් තොරතුරු සොයා ගැනිමට නොහැක. තිබෙන තොරතුරු සමඟ මේවා ලේඛන වලින් කපා හැරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇත. මෙවැනි ගැටලු මින් ඉදිරියට නොවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් ක්‍රියාත්මක කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,168,196 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම වූ රු. 9,772,843 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ජල ගාස්තු** | | |
| සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවලට අදාළව පෞද්ගලික අංශයේ ජල පාරිභෝගිකයින් 2546 ක ගෙන් අයවියයුතු හිඟ ජල ගාස්තු රු. 6,233,415 ක් හා රජයේ ආයතන 16 කින් අයවියයුතු රු. 89,953 ක් අයකර ගැනීම සඳහා 2022 මාර්තු 31 වනවිටත් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ජල ගාස්තු අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාපතිවරයාගේ නිල කැබ් රථය ඔහු විසින්ම ධාවනය කරමින් තිබියදී 2018 ඔක්තෝබර් 01 දින ත්‍රීරෝද රථයක ගැටී අනතුරට ලක්ව තිබූ අතර රථය අලුත්වැඩියා කිරීම සඳහා රු. | මේ වනවිට පරීක්ෂණය සිදු කර ඇති බව. | අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

1,950,303 ක් වැයකර තිබුණි. අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව පිළියෙල කර තිබුණ ද, පළාත් පාලන කොමසාරිස්වරයා විසින් 2019 මාර්තු 14 දින පත්කර තිබූ පරීක්ෂණ මණ්ඩලය විසින් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අවසන් වාර්තාව 2022 ජූනි 30 දින වනවිටත් පිළියෙල කර නොතිබීමෙන් රක්ෂණාවරණය මඟින් ප්‍රතිපූරණය කර නොතිබූ රු. 630,244 ක ක අලාභය සඳහා වගකිව යුතු පාර්ශව හඳුනාගැනීමට හා ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි.

**4.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පඹහින්න සතිපොළ සංවර්ධනය සඳහා 2015 සහ 2017 වර්ෂයන්හි දී රු. 4,561,397 ක් වැයකර තිබුණ ද, පොළ පැවැත්වීමට සුදුසු පරිදි ඉතිරි සංවර්ධන කටයුතු සිදුකර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එය නිෂ්කාර්යයව පැවතුණි. | 2018 වසරේ මෙම පොළ භූමියේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සති පොළ ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු අනුමැතියට යවා ඇති අතර මුදල් ප්‍රතිපාදන ලැබුණු පසු සතිපොළ වෙළඳුන්ට පරිහරණය කළ හැකි පරිදි සකස් කිරීමට කටයුතු කරන බව. | ප්‍රතිපාදන සපයා ගෙන පොළ පැවැත්වීමට සුදුසු පරිදි සංවර්ධනය කළ යුතුය. |